# ලාබයි ලාබයි



මිලයට ගැනීමට හෝ විකුණා ගන්ට
ඉරිදට හැකිය ඕනෑ බඩුවක් ඔබට
එම විට ඇවිත් අතුරේ ඉරිදා පොළට
බැලුවිට හැකිවේය ඔබෙ අදහස ලෙසට

ලියුම් කවරයක ඉහළින් මුද්‍රණය කරන ලද මෙම කවියෙන් කියැවෙන්නේ බුලත්සිංහල පළාතේ සුප්‍රසිද්ධ ම වෙළඳපොළ වන අතුර ඉරිදා පොළ ගැන ය. සෑම ඉරිදාවක ම උදයේ සිට සවස් වන තුරු පැවැත්වෙන මෙයින් පළාතට සිදු වන්නේ විශාල සේවයකි. ඉරිදා දිනයට බඩු විකිණීමට මෙන් ම බඩු මිල දී ගැනීමට පැමිණෙන පිරිස අති විශාල ය. පොළ පවතින දාට සාමාන්‍යයෙන් පාරේ දුවන බස්රථවලට අමතරව වෑන් රථ ආදී වාහන හිමි නොයෙකුත් දෙනා නොයෙකුත් පෙදෙස්වලට ගමනාගමන සේවය සපයති. අතුර-ඉංගිරිය, අතුර-පරගොඩ, අතුර-කලවැල්ලෑව, අතුර-ඈගල්ඔය ආදී අතුර කේන්ද්‍ර කොට ගත් ගම් අතර ප්‍රධාන වශයෙන් මෙම සේවාවන් පැවැත්වේ. බඩු විකිණීමට පමණක් නොව නොයෙකුත් බඩු එකතු කර ගැනීම සඳහා වෙළඳ පිරිස් මෙතැනට පැමිණෙති. පිටින් එන වෙළෙඳුන් පළාතේ වැවෙන, නිපදවෙන බොහෝ දේ එකතු කර ගන්නා මධ්‍යස්ථානය අතුර ඉරිදා පොළ ය. අපේ පාරෙන් ද උදේ පාන්දර සිට ම වෙළඳාම පිණිස නොයෙකුත් දේ හිස පිට, කරමත තබාගෙන හයියෙන්හයියෙන් යන ගැහැනු පිරිමි බොහෝ ය. ගමේ එළවළු, පළා වර්ග, වට්ටිපෙට්ටි, කිතුල් හකුරු, බුලත්පුවක්, කෙසෙල්කැන් ආදිය මේ අතර වේ.

බණ්ඩාරගම, මොරොන්තුඩුව ආදී පෙදෙස්වලින් පොළ වෙත පැමිණෙන පොල් අතු කරත්ත පේළියේ ගෙජ්ජි නාදය සෙනසුරාදා හැන්දෑවේ දී බොහෝ ඈතට ඇසෙයි. වෙළඳාමෙන් පසු සියලු ම හිස් කරත්ත ඉරිදා සැන්දෑවේ දී ආපසු යන විට ඇසෙන ගෙජ්ජි ශබ්දයේ වේගවත් සැහැල්ලු බවක් දැනෙනවා සේ ය.

එළවළු, කරවල, මාළු, රෙදිපිළි, පොල්, සිල්ලර බඩු, බුලත්පුවක් ආදී සෑම පාරිභෝගික භාණ්ඩයක් ම මෙතනින් මිල දී ගත හැකි ය. උදේ පාන්දරින් ම ඇදී එන වෙළඳ පිරිස උදයේ අට වන විට සියලු බඩු වෙළඳාම සඳහා සකස් කර ගනිති. එම කාලය වෙළඳාම පටන් ගන්නා වෙලාවයි. ඉන්පසුව තොරතෝංචියක් නැතිව ''ලාබයි ලාබයි'' ශබ්දය




දෙසවන් සිසාරා යයි.

එවකට පැවතුණු පොළේ බඩු මිල ගණන් පිළිබඳ යමක් පැවසීම වැදගත් යයි සිතමි. එවකට බඩු විකුණුවේ රාත්තල් අවුන්සවලිනි. හාල්, මුංඇට, කඩල, පරිප්පු ආදිය සේරුවෙන් මැනීම සිදු විය. හාල් සේරුවක් ශත විසි පහක්, තිහක් පමණ විය. හාල් සේරුවක ප්‍රමාණය අද කිලෝ ග්‍රෑම් එකක ප්‍රමාණයට බොහෝ දුරට සමාන ය. අර්තාපල් අල රාත්තලක් සත විසිපහක්, තිහක් පමණ වූ අතර තරමක් පලුදු වූ අල රාත්තලක් සත පහළොවකට හෝ රාත්තල් දෙකක් සත විසි පහකට ගත හැකි ය. රතුලූනු රාත්තලක් සත විසි පහක් හෝ තිහකි. රටලූනු සත පහළොවක් විස්සක් පමණ වේ. වියළි මිරිස් රාත්තලක් සත හැටකට හෝ හැත්තෑවකට ගත හැකි ය. හොඳම හොඳ කට්ටා කරවල රාත්තලක මිල රුපියල් එකකුත් සත පනහක් හෝ හැටක් පමණි. මේ ආදී වශයෙන් බලන විට එදා රුපියලක වටිනාකම කෙතෙක් ද කියා අපට සිතා ගත හැකි ය. ''ලාබයි ලාබයි ලාබයි..'' යන වචනය හැම වෙළඳ මුවකින් ම වාගේ පිටවේ. අයිස් ක්‍රීම් විකුණන වෙළඳ බයිසිකල්වලින් නැග එන නලා ශබ්දය එකිනෙක නොපරදින ලෙසට දෙසවන් තුළට කා වදියි. සමහර වෙළඳ රථවල ශබ්ද විකාශන යන්ත්‍රයන් යොදාගෙන නොයෙකුත් පණිවිඩ දෙමින් තම ව්‍යාපාර සාර්ථක කර ගැනීමට වෙර දරන පිරිසකි.

''ගහෙන් කඩල. මෝලෙ දාල, හීන් කරල, නැටි අහුලල, හොඳට හළල, පෙට්ටි ගහල, ඇතුළෙ දමල, පෙට්ටි වහල, රට පටවල යවන ඒව. වැනිල දාල , සුවඳ කරල, රසට හදල, කොළේ ඔතල, පැකට් කරල මෙන්න දෙනව හොඳ තේ කොළ. එන්න ගන්න. අරං යන්න. නිකං වගේ.'' මේ ලෑලි තට්ටුවක තේ කොළ දමාගෙන වෙළෙඳාමේ යෙදෙන වෙළෙන්දෙකුගේ මුවින් වරින්වර කියැවෙන යාදින්නකි.

නොයෙකුත් වර්ගයේ බේත්හේත් විකුණන පිරිස්, විජ්ජා පෙන්වන, සර්පයින් නටවන, ප්‍රදර්ශනය කරන පිරිස අඩු නැත. ඔවුහු සෙනඟ රැස් කරගෙන වියත් බවින් දේශන පවත්වා තම ව්‍යාපාරය සරු කර ගනිති. බොහෝ පිරිස් කතාවෙන් ළං කර ගැනීමට ඔවුන් දක්වන්නේ මහත් දක්ෂ කමකි. කවියක් කියමින් හෝ දෙපසට සොලවන විට ශබ්ද නගන රබානක උපකාරයෙන් හෝ සෙනඟ රැස් කර ගනිති. එකා දෙන්නා බැගින් එකතුවන පිරිස ඔවුන් වටා රැස්වෙති. ඉන්පසු දේශනය පටන් ගන්නා තෙල් බෙහෙත් වෙළෙඳ මහතා පිරිස තමා වෙත ඇඳ බැඳ තබා ගනිමින් සිය දේශනය පවත්වා ගෙන යයි. පිරිස සිනා සයුරේ ගිල්වමින් නොයෙකුත් රසකතා කියමින් ඔහු තම වෙළඳාම් කාර්යය කරගෙන යයි. වට වූ පිරිස වඩාත් ම සිටින්නේ ඔහු විකුණන දෑ මිල දී ගැනීමට ම නොව රසවත් කතා අසා සිනාසීමට ය.

මෙවැනි වෙළඳාම් සඳහා පැමිණෙන සෑම දෙනා ම ඉතාමත් දක්ෂ කථිකයෝ ය. මට මතක ඇති එක් පුද්ගලයකු නම් ඉංගිරිසි බෙහෙත් විකුණන තරුණයෙකි. සමහර දිනක යුරෝපීය ඇඳුම් ඇඳගෙන එන ඔහු තවත් දිනක ආරිය සිංහල ඇඳුමින් පැමිණෙයි. ඔහුට අපි නාහේනේ ගම්ලත් යයි කියමු. ඔහුගේ ආකර්ෂණීය කථාව අසන්නට විශාල පිරිස් පොදිකති. දෙපිට කැපෙන වචන දෙඩීමට ඔහු දක්වන දක්ෂතාව පුදුමසහගත ය. ඔහු විකුණන්නේ බෙහෙත් පෙත්තකි. ඔහු කියනා ලෙසට එය ලංකාවේ කිසි ම ෆාමසියකින් හෝ කඩයකින් මිල දී ගත නොහැකි ය. පිටරටින් එවන්නේ ඔහුට පමණ ය. ඔහු පත්කර ඇත්තේ ප්‍රචාරක නිලධාරියකු ලෙස යයි පුනපුනා කියයි. බෙහෙත් විකුණුවේ ඇතත් නැතත් ඔහුගේ වැටුප ඔහුට ජර්මන් කොම්පැනියෙන් එවන බව කියන්නේ රුපියලේ කොළයක් පෙන්නා ''මෙන්න මේ වගේ කොළ තුන්සීයක් මට කොම්පැනියෙන් ගෙවනවා'' යනුවෙන් උද්දාම හැඟීමෙන් මුහුණ පුම්බා ගෙන ය. (එවකට රුපියල් තුන් සියයක් යනු ඉතා විශාල මුදලකි.)

"දැන් මේ මහත්තුරු බලාගෙන ඉන්නේ නයි නටවනව බලන්නද? නෑ. සර්කස් බලන්නද?, නෑ. විජ්ජා බලන්නද? නෑ. තෙල් බෙහෙත් අරන් යන්නද? නෑ. එහෙනම් මොකටද? මේ මිනිහ කරන කතාව අහල තමන්ගේ ජීවිතයට වැදගත් පණිවිඩයක් අරන් යන්න. ජීවිතය ටොපේටොප් එකට ගෙවන්න. එහෙම නේද හලෝ'' ගම්ලත් කෙනෙකුට ඇඟිල්ල දිගු කොට විමසයි. පුද්ගලයා ඔළුව වනයි.

"ආන්න දැක්ක නේද ඒ මහත්තයා හරි වාසනාවන්තයි. එයා විතරක් නෙමෙයි මෙතන ඉන්න අනිත් ඔක්කෝමත්. හොඳ දෙයක් අහලා හොඳ දෙයක් කාලබීලා හොඳට ජොලියේ ජීවත් වෙන්න කැමති අය.''

''මා ළඟ විකුණන මොකුත් නෑ. ගුලි, කල්ක, චූර්ණ, ගුග්ගුලු, අරිෂ්ඨ, ආසව, පත්තු මොකුත් නෑ. මා ළඟ තියෙන්නේ ඔක්කොට ම දෙන්න පුංචි තෑග්ගක් විතරයි. ඒක දුන්න මං ගෙදර ගියා.''

මේ ආකාරයේ බොහෝ දේ පවසමින් පිරිස තමා කෙරේ නම්මවා ගන්නා ඔහු ක්‍රමයෙන් තම ව්‍යාපාරයට පිරිස කොටු කර ගනියි.

"දැන් ඔය එකඑක්කෙනා ඉස්සරහට එන්න" ඔහු වටවී සිටින පිරිසෙන් තරුණ අයෙකු ඉදිරියට ඇද ගනියි. ඔක්කොම බලන්න මේ මල්ලි දිහා. මෙයාට ලොකු ඔළු ගෙඩියක් තියෙනව. මොනවද මේක ඇතුළෙ තියෙන්නේ?. මැටි ද? පිදුරු ද? මොළේ... මොළේ... මොළේ නැතුව ජීවත් වෙන්න පුළුවන්ද? ඔළුව ඇතුළෙ මොළයක් තියෙන හින්දා තමයි මගේ වටේ රැස්වෙලා ඉන්නේ. ඒ වගේ ම මෙයාට හොඳ පපුවක් තියෙනවා.'' ගම්ලත් තරුණයාගේ පපුවට තට්ටුවක් දමමින් කියයි. ''මේකේ කුණු නෑ. ජරාව නෑ. නියම පපුවක්. එහෙම නේද මහත්වරුනි. පපුවෙ කුණු තියෙන කෙනෙකුට, මොළේ නැති කෙනෙකුට මෙහෙම ඇවිදිල්ලා ඉන්න බෑ. පපුව කකියන්න ගන්නවා. මොළේ කහන්න ගන්නවා. පුපුරු ගහනවා. හිමින් සැරේ කුටුකුටු ගගා ෂේප් වෙලා මාරුවෙලා යනවා. ජීවිතය අනතුරේ. " තමා වටා රැස් වී සිටින පිරිස නවතා ගැනීම සඳහා ඔහු කියන වචන මාලාව අසන කිසිවෙක් එතැනින් පිට වී නොයයි.

"දැන් මේක බලන්න මහත්වරු. මේකට කියන්නේ මොකක්ද?'' ඔහු තරුණයාගේ බඩට තට්ටු කරමින් අසයි. අන් අයගේ මුහුණ දෙස බලයි. දන්නැද්ද? දන්නැද්ද හලෝ.? අම්මපා දන්නැද්ද?'' කෙඳිරිලි හඬකින් කවුරු හෝ හෙමිහිට "බඩ" යනුවෙන් පවසයි. ''මොකක්ද කීවේ? මොකක්ද බඩ නේද?'' බඩ. බඩ. බඩ. මේකේ මොනාද තියෙන්නේ. බත්, පාන්, රොටි, ආප්ප, ඉඳි ආප්ප, පිට්ටු, කැවුම්, කොකිස්, කුකුල් මස්, හරක් මස්, කසිප්පු, අලහොදි, සීනිකරිඃකද්ඃකදං. ඒවද? ඒවද? නෑ මේකේ තියෙන්නේ බඩවැල් හැතැම්ම ගානක් දිගට. කුඩා බඩවැල, මහ බඩවැල, ආමාශය, අක්මාව, පිත්තාසය, වකුගඩු. අන්න ඒ වගේ දේවල්. ලොකුවට බොක්ක තියෙනවා. මොන බොක්කද? බෙංගාල බොක්කද? බේරුවල් බොක්කද? නෑ. ඕකට තමයි අපි කන බොන දේවල් ඔක්කොම ගිහින් වැටෙන්නෙ.''

''අපි උදේ ම මොකද කරන්නේ. මේක හොඳට පුරෝනවා. ටං ටාං ගාන්න. දවල්ට කනවා ටිං ටීං ගාන්න. රෑට ඩං ඩූං ගාන්න. අපි ගිලිනවා මිසක් මේක ගැන හොයනවද? කන දේවල්වලට මොකද වෙන්නේ. පහුවදාට ඔක්කොම කොහෙටද යන්නෙ?''

''මේ මහ බඩ හොඳට තියා ගන්න ඕනෙ. නැත්තං ලෙඩේ. මහත්තයෝ ඕකේ ඇඹරෙන ජරාවෙන් තමයි අපි ජීවත් වෙන්නේ. ඇඟට ලේ උනන්නේ. අතපය එස වෙන්නේ. අඬන්න පුළුවන් වෙන්නේ. පනින්න පුළුවන් වෙන්නේ. වැඩ කරන්න පුළුවන් වෙන්නේ.''

''ඒකට ඉඳලහිටල පොඩි සාත්තුවක් දුන්ණොත් කොහොම වෙයිද? ඇඟ මහත් වෙනවා. ඇඟට ලේ උනනවා. හමේ රැළි ඇරෙනවා. රත්‍රං පාට වෙනවා. මූණ ලස්සන වෙනවා. දුවන්න පනින්න පුළුවන් වෙනවා. පිනුම් ගහන්න පුළුවන් වෙනවා. ඒ විතරක්ද තව කොච්චර වැඩ තියෙනවද? ඒ ඔක්කොම පුළුවන් වෙනවා.''

''මේකට මොකද කරන්න ඕනේ? කරන්න ඕන දේ මං කියන්නම්. එන්න ඔය එක් කෙනෙක් ඉස්සරහට. ඔය අම්මත් එන්න. ආ ඔය අත දිග හරින්න. මේ සාස්තරයක් කියන්න හදනවද? නෑ. ලොකු තෑග්ගක් අතට දෙන්නයි හදන්නේ. තෑගි ගන්න කැමතියි නේද? මුළු ජීවිතේ ම ලස්සන වෙන තෑග්ගක් ගන්න." ගම්ලත් මෙසේ කියමින් තම බෑග් එක ඇර එතුළින් පොඩි කුප්පියක් අතට ගනියි. මේ මොනවද? මේකේ මොනව තියෙනවා කියලද හිතන්නේ? මේ අම්මලට, මේ තාත්තලට මේ අයියලට, මේ අක්කලට, මල්ලිලට, නංගිලට, ජීවිතේ හම්බු වෙන් නැති හොඳ තෑග්ගක් මේකෙ තියෙන්නෙ. මේ තෑග්ග දෙන්නෙ දහ දෙනෙකුට විතරයි. ඉල්ලල පොර කන්න එපා." ඉදිරියට පැමිණි සිව් දෙනා තෑග්ග ලැබෙන තුරු අත දිග ඇරගෙන ම සිටිති. ගම්ලත් කුප්පිය අරිමින් පුංචි පෙත්ත බැගින් පෙති හතරක් ඔවුන් අතේ රහසින් තබා අත මිට මොළවන්නේ ඔහු ම ය. දැන් මේ අතේ තියෙන එකෙන් අංජනං බලන්න පුළුවන්ද? සෝවාන් වෙන්න, රහත්වෙන්න එහෙම නැත්නම් අජර-ාමර වෙන්න, සකෘධාගාමි වෙන්න, අනාගාමි වෙන්න නිවන් දකින්න පුළුවන්ද? ඒව කරන්න බැහැ. උඩින් යන්න. පොළොව පලාගෙන යන්න, මුහුද දෙබෑකරගෙන යන්න ඉර හඳ උලා කන්න. පුලුවන්ද? බැහැ බැහැ ඒව බැහැ.''

''අත දිග අරින්න එපා. කාටවත් පෙන්නන්න එපා. ඔහොම්ම දැන් කට ළඟට කිට්ටු කර ගන්න. එක පාරට ම කටේ දාගන්න. හා දැන් ගිලින්න. දැන් ඔන්න ජීවිතේට ලැබෙන්නෙ නැති තෑග්ගක් ඔබේ බඩේ. අද යන්න ගෙදර. ගිහිල්ල කන්න ලොකු බත් පිඟානක්. ඊට ඉස්සෙල්ලා මොනව හරි ගන්නව නම් ඒකට කිසිම වරදක් නැහැ. හැබැයි ගෙදර වළං පොඩි කරන්න, ගෑනිට තලන්න තහනම්. හොඳ සනීපෙට නිදා ගන්න ලොකුවයින් රෙද්දක් පෙරවගෙන. පාන්දර කතා කරයි. කවුද කතා කරන්නෙ?. කවුද ගෙදර උන්දැද? නෑ නෑ. මේ බඩ බඩ. එයා කියයි දැන් යන්න ඕනෙ කියලා. කොහේද? කොහේද? දිල්ලි යන්නද? එංගලන්තෙ යන්නද? නෑ නෑ. වැසිකිලියට. එයා එහෙම කිව්වට අද

16 වන පිටට